රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2023

මගේ අංකය : EST-3/POLIC/04/0064
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.04.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් වෙත වැටුප් ගෙවීම**

2023 පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ට පහත සහනය ලබා දීමට 2023.04.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. ඒ අනුව, ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තියේ විධිවිධාන අනුව 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි දැනට වැටුප් රහිත නිවාඩු මත සිටින රාජ්‍ය නිලධරයන්ට, 2023.03.09 දින සිට 2023.04.25 දින තෙක් වූ කාලය වැටුප් සහිත නිවාඩු ලෙස සලකා නිලධරයාට හිමි මූලික වැටුප ගෙවීමට කටයුතු කළ යුතු ය.

03. නිලධරයෙකුට ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය අනුව ලබා ගත හැකි නිවාඩු හිලව් කිරීමෙන් පසු ඉතිරි වන කාලය සඳහා ඉහත පරිදි වැටුප් ගෙවිය යුතු ය.

04. මෙම විධිවිධාන 2023 පළාත් පාලන ඡන්ද විමසීමට පමණක් අදාළ වේ.

කේ.ඩී.එන්.රංජිත් අශෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය..........................................
.............................................................චක්‍රලේඛය / උපදෙස්
ලිපිය රජෙන් කළ.......... දින සිට
ඔබේ සම්බන්ධතාවට අදාළ ... සඳහා
ගරු ආචාර්ය කාර තුමාගේ අනුමැතිය: 2023.04.29
දින ලබා දී ඇති බව සහතික කරමි.
.................. / ..................... / ..................... අත්සන.

දුරකථන : 0112-692159
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-iii@pubad.gov.lk